සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2018 ජූලි

## (AA15) ව්‍යාපාර මෙහෙයුම් සහ කළමනාකරණය

(Business Operations and Management)

2018-07-29
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 ව්‍යාපාර සංවිධානයක ඇති ඕනෑම පද්ධතියක පොදු මූලිකාංග වන්නේ:

(1) යෙදවුම්, නිෂ්පාදිතය සහ ඉල්ලුම.
(2) යෙදවුම්, ක්‍රියාවලිය සහ නිමැවුම්.
(3) යෙදවුම්, පරිභෝජනය සහ අවශ්‍යතා.
(4) යෙදවුම්, සේවා සහ භාණ්ඩ.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ශාරීරික (භෞතික) අවශ්‍යතාවයකට උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ආරක්ෂාව. (2) ගරුත්වය. (3) ජලය. (4) සම්බන්ධතා.

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, සීමාසහිත පොදු සමාගමක් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව 02 කි.
(2) මහජනතාවට කොටස් නිකුත් කිරීමට ඉඩදෙනු ලැබේ.
(3) පිහිටුවීම සඳහා නෛතික අවශ්‍යතා නොමැත.
(4) වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත්කිරීම අනිවාර්ය නොවේ.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, කාර්ය පරිසරයෙහි (task environment) සංරචකයක් **නොවන්නේ** කුමක් ද?

(1) සැපයුම්කරුවන්. (2) තරඟකරුවන්. (3) සේවකයන්. (4) ගනුදෙනුකරුවන්.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, සංවිධානයක ශක්තියක් (strength) ලෙස සලකනු ලැබිය හැක්කේ කුමක් ද?

(1) රාජ්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම්. (2) සන්නාම නාමය (brand name).

(3) අලෙවිකරණ විශේෂඥතා අඩුවීම. (4) තරඟකරුවන්ගේ මිල ගණන්.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයේ මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

(1) සංවිධානමය සංස්කෘතිය. (2) වටිනාකම් පද්ධතිය.

(3) මානව සම්පත්. (4) තරඟකරුවන්.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, හොඳ ප්‍රවාහන පද්ධතියක ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) ආරක්ෂාව. (2) වේගය.

(3) පිරිවැය කාර්යක්ෂමතාව (cost effective). (4) ඉහත සඳහන් සියල්ලම.

1.8 මානව සම්පත් කළමනාකරණයේදී, නව සේවකයා සංවිධානයට විධිමත් ලෙස හඳුන්වාදීම හඳුන්වනු ලබන්නේ:

(1) අනුස්ථාපනය (induction) ලෙසයි. (2) තෝරාගැනීම ලෙසයි.

(3) පුහුණුව ලෙසයි. (4) බඳවා ගැනීම (recruitment) ලෙසයි.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, ප්‍රතිලාභ (rewards) සඳහා අදාළ වන බාහිර තීරණායකයක් වන්නේ කුමක් ද?

(1) සංවිධානයේ දීමනා ප්‍රතිපත්තිය. (2) ආර්ථික තත්ත්වය.

(3) සේවායෝජකයාගේ ගෙවීමේ හැකියාව. (4) රැකියාවේ වටිනාකම.

1.10 පහත සඳහන් ඒවා අතුරෙන්, මානව සම්පත් කළමනාකරණයේ සේවායෝජකයාගේ පැතිකඩ අනුව, ආචාරධර්ම සම්පන්න නොවන කටයුත්තක් **නොවන්නේ** කුමක් ද?

(1) කායික හිංසනය.

(2) ළමා ශ්‍රමය භාවිත කිරීම.

(3) නම්‍යශීලී වැඩකරන පැය ගණන් පැවතීම.

(4) ඵලදායිතාවය වැඩි කිරීම සඳහා සේවකයින් පීඩනයට ලක්කිරීම.

1.11 තනි රැකියා පිරිවිතරයක (job specification) ඇතුළත් මූලිකාංගයක් වන්නේ:

(1) රැකියාව හඳුනාගැනීම (job identification). (2) ළඟාකරගත යුතු ඉලක්ක.

(3) කාර්යසාධනය තක්සේරු කිරීමේ තීරණායක. (4) විශේෂ ශාරීරික හැකියාවන්.

**1.12** පහත සඳහන් අලෙවිකරණ සංකල්ප අතුරෙන්, පාරිභෝගික කොටස, පක්ෂපාතීත්වය සහ යාවජීව වටිනාකම් තුළින් ලාභය වර්ධනය කිරීම කෙරෙහි සැලකිල්ලක් දක්වන්නේ කුමන අලෙවිකරණ සංකල්පය ද?

(1) සමාජීය (societal) අලෙවිකරණ සංකල්පය. (2) ගනුදෙනුකරු සංකල්පය.

(3) සාකල්‍යවාදී (holistic) අලෙවිකරණ සංකල්පය. (4) විකුණුම් සංකල්පය.

**1.13** කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් මිලදී ගැනීම සහ පරිභෝජනය කිරීම නිරන්තරයෙන් සිදුකරන නිත්‍ය පාරිභෝගිකයන් සහිත වෙළෙඳපොළ:

(1) විභව වෙළෙඳපොළ (Potential market) වේ. (2) පවතින වෙළෙඳපොළ (Available market) වේ.

(3) ව්‍යාපාරික වෙළෙඳපොළ (Business market) වේ. (4) සත්‍ය වෙළෙඳපොළ (Actual market) වේ.

**1.14** පහත සඳහන් ප්‍රකාශන අතුරෙන්, තොරතුරු කළමනාකරණය සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) බාහිරජාල (extranet) යනු තෝරාගත් බාහිර පාර්ශවයන්ට ප්‍රවේශ විය හැකි පුද්ගලික ජාලයකි.

(2) අන්තර්ජාලය යනු TCP/IP නාමාවලි (protocol) හරහා සන්නිවේදනය කරනු ලබන ගෝලීය පරිගණක ජාලයකි.

(3) අභ්‍යන්තර ජාලය (Intranet) යනු සංවිධානයක බාහිරින් ඇති ජාලයකි.

(4) අභ්‍යන්තර ජාලයක් මුරපද (passwords) සහ ඇතුළුවිය නොහැකි ද්වාර (fire walls) වැනි ආරක්ෂිත මිනුම්වලින් ආරක්ෂා කරනු ලැබේ.

**1.15** පහත සඳහන් ඒවා අතුරෙන්, පහසුකම් පිරියතයක (facility layout) අරමුණක් **නොවන්නේ** කුමක් ද?

(1) ශ්‍රම කාර්යක්ෂමතාව භාවිත කිරීම. (2) ද්‍රව්‍ය මෙහෙයවීමේ පිරිවැය අවම කිරීම.

(3) නඩත්තු, මනා ලෙස සිදුකිරීමට උනන්දු කරවීම. (4) ශ්‍රම පිරිවැටුම වැඩි කිරීම.

*අංක 1.16 සිට 1.20 දක්වා ප්‍රශ්න වල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය, ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

**1.16** ………………… *[ගනුදෙනු සැකසුම් පද්ධතිය (Transaction Processing System - TPS) / තීරණ සහායක පද්ධතිය (Decision Support System - DSS)]* යනු කළමනාකරණයේ මෙහෙයුම් මට්ටමේදී ක්‍රියාත්මක වන තොරතුරු පද්ධතියකි.

**1.17** ………………… *[ව්‍යවසාය සම්පත් සැළසුම්කරණය (Enterprise Resource Planning (ERP) / විධායක සහායක පද්ධතිය (Executive Support System - ESS)]* යනු ව්‍යාපාරය කළමනාකරණය කිරීමට සංවිධානයකට සංකලිත යෙදවුම් (integrated applications) පද්ධතියක් භාවිත කිරීමට ඉඩ සලසන ව්‍යාපාරික ක්‍රියාවලි කළමනාකරණ මෘදුකාංගයයි.

**1.18** ………………… *(අලෙවිකරණය සහ විකුණුම් / තාක්ෂණික සංවර්ධනය)* යනු පොටර්ගේ වටිනාකම් දාමයේ (Porter's Value Chain) උපකාරක ක්‍රියාකාරකමකි.

**1.19** ………………… *[රැකියා පුළුල් කිරීම (Job enlargement) / රැකියා භ්‍රමණය (Job rotation)]* යනු නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ සේවකයෙකු එක් කාර්යයකින් වෙනත් කාර්යයකට මාරු කිරීමේ (shifting) ක්‍රියාවලියයි.

**1.20** ………………… *[විභේදනය කරන ලද අලෙවිකරණය (differentiated marketing) / ඒකාග්‍රතා අලෙවිකරණය (concentrated marketing)]* යටතේ, ආයතනයක් එක් එක් බණ්ඩනයන් සඳහා වෙන වෙනම අලෙවිකරණ මිශ්‍ර උපක්‍රමයන් සහිත නිෂ්පාදිත සහ සේවා සංවර්ධනය කරනු ලැබේ. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

ව්‍යාපාර සංවිධානයක් යනු සාමූහිකව වැඩ කරමින් එකම වාණිජ ඇල්මකින් ලුහුබැඳ යන පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමකි. ව්‍යාපාර සංවිධාන විවිධ ආකාරවලට වර්ගීකරණය කළ හැකි අතර, තනිපුද්ගල (කේවලස්වාමි) ව්‍යාපාර වඩාත් සුලභ ව්‍යාපාර හිමිකාරිත්ව ආකෘතියකි. හිමිකාරිත්වය කෙසේ පවතිද යන්න සැලකිල්ලට නොගෙන, ඕනෑම ව්‍යාපාර සංවිධානයක් සඳහා උපකාරක සේවා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කේවලස්වාමි ව්‍යාපාරයක වාසි තුනක්(03) සහ අවාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(b) ව්‍යාපාර සංවිධානයක් සඳහා උපකාරක සේවාවක් වශයෙන් බැංකුවලින් සහ මූල්‍ය ආයතනවලින් ලබාගත හැකි සේවා පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

ව්‍යාපාර සංවිධානයක් එහි ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩ සහ සේවා නිපදවයි. ගනුදෙනුකරුවෙකු විසින් කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් තෝරාගැනීමේදී ගුණත්වය ප්‍රධාන සාධකයක් බවට පත්වී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ව්‍යාපාර සංවිධානයක් කෙරෙහි ගුණත්ව / තත්ත්ව කළමනාකරණයෙහි (quality management) වැදගත්කම **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) නිෂ්පාදනය කරන ලද නිෂ්පාදිතවල ගුණත්වය මැනීමේ මානයන් (dimensions) හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

ඕනෑම සංවිධානයක ඉතාම වැදගත්ම සම්පත වන්නේ මානව සම්පතයි. එමනිසා, සංවිධානයේ සාර්ථකත්වය කෙරෙහි මානව සම්පත් කළමනාකරණය අත්‍යවශ්‍ය වන අතර, එයට විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයක් සඳහා මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) පුහුණු කිරීමේ ක්‍රියාවලිය තුළ ඇතුළත් පියවරයන් **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 05 වන ප්‍රශ්නය

සංවිධානයක ස්වභාවය සහ අරමුණ කුමක් වුවද, අලෙවිකරණය ඕනෑම සංවිධානයකට අත්‍යවශ්‍ය පැතිකඩක් වන අතර සඵලදායී සන්නිවේදන උපායමාර්ගයක් තුළින් තරඟකාරිත්වය වැඩිවෙමින් පවතින වෙළෙඳපොළක විශාල වාසිදායක තත්ත්වයක් උදාකරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ව්‍යාපාර සංවිධානයකට අලෙවිකරණය වැදගත් වන්නේ කුමක් නිසාදැයි යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) සාර්ථක සන්නිවේදනයක ලක්ෂණ (characteristics) හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

1980 වර්ෂයේදී ගම්පහ ආරම්භ කළ **සීමාසහිත බර්ට් සහ පුත්‍රයෝ සමාගම** පවුලකට අයත් වූ ව්‍යාපාරයකි. දැරිය හැකි මිලකට දිවයින පුරා ගුණාත්මක බවින් යුතු අලුත් තත්ත්වයේ බේකරි ආහාර ද්‍රව්‍ය විකිණීම සඳහා සමාගම ප්‍රසිද්ධව ඇත. සේවකයන් 600 කට ආසන්න සංඛ්‍යාවක් සහිතව දිවයින පුරා පිහිටි අලෙවිහල් 50 ක දැනට ව්‍යාපාරය මෙහෙයවනු ලැබේ. එහි මෙහෙයුම් සඳහා **සීමාසහිත බර්ට් සහ පුත්‍රයෝ සමාගම** දැනටමත් ISO සහතිකකරණය හිමිකරගෙන ඇත. සම්ප්‍රදායික අලෙවිහල්, ආපනශාලා බවට පරිවර්තනය කිරීම තුළින් ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු ව්‍යාප්ත කිරීමට හිමිකරුවෝ මෑතකදී තීරණය කළහ. මේ අතරතුර, ජාත්‍යන්තර ක්ෂණික ආහාරදාම සහිත ආපනශාලාවන්ද ඔවුන්ගේ මෙහෙයුම් දිවයින පුරා ව්‍යාප්ත කරමින් සිටී. මෙම තියුණු තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා **සීමාසහිත බර්ට් සහ පුත්‍රයෝ සමාගමේ** කළමණාකාරීත්වය විසින් අන්තර්ජාලය හරහා සහ ක්ෂණික සෘජු ඇමතුම් සේවාවන් හරහා එහි නිෂ්පාදිත නිවෙස් වෙත බෙදාහැරීමේ සේවාවක් ආරම්භ කිරීමට තීරණය කරන ලදි. මෙම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම විසින් අන්තර්ජාලය හරහා මිලදී ගැනීමේ පහසුකම් සහිත ආකර්ශනීය වෙබ් අඩවියක් වහාම සංවර්ධනය කිරීම අවශ්‍ය වන බවත් පැය 24 පුරා ක්‍රියාත්මක වන ඇමතුම් මධ්‍යස්ථානයක් පිහිටවිය යුතු බවත් තොරතුරු තාක්ෂණ කළමනාකරු යෝජනා කර ඇත. යෝජිත පුළුල් කිරීමේ කටයුතු පහසු කරවීම සඳහා තවත් බෙදාහැරීමේ බයිසිකල්කරුවන් (delivery riders) 150 ක් සහ ඇමතුම් මධ්‍යස්ථාන සඳහා සේවකයන් 20 ක්ද බඳවා ගැනීමට සමාගම සැලසුම්කර තිබේ. බල ශක්තිය කාර්යක්ෂමව යොදා ගන්නා (energy-efficient) උඳුනක් සිංගප්පූරුවේ සැපයුම්කරුවෙකුගෙන් ආනයනය කිරීම තුළින් නිෂ්පාදන පිරිවැය අඩුකරලීමේ වාසිදායක අවස්ථාවක් සමාගමේ නිෂ්පාදන කළමනාකරු අවධාරණය කර තිබේ. සැපයුම්කරුවන් සමග ශක්තිමත් සම්බන්ධතා පවත්වා ගැනීම සම්බන්ධයෙන් **සීමාසහිත බර්ට් සහ පුත්‍රයෝ සමාගම** ප්‍රමුඛතාවය දී තිබේ. දැනට සමාගම එහි එළවළු ආදී සියලුම යෙදවුම් ගොවීන්ගෙන් සහ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සෘජුවම මිලදී ගනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත බර්ට් සහ පුත්‍රයෝ සමාගම** කෙරෙහි ගෝලීයකරණය ධනාත්මකව බලපා ඇති ආකාරයන් තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) **සීමාසහිත බර්ට් සහ පුත්‍රයෝ සමාගමෙහි** අලෙවිකරණ මිශ්‍රයේ (4‘P’s), ඇතුලත් විචල්‍යයන් තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(c) ඇමතුම් මධ්‍යස්ථානය සමාගම තුළ (in-house) පවත්වාගෙන යෑම වෙනුවට, ඇමතුම් මධ්‍යස්ථාන කාර්යයන් බාහිර මූලාශ්‍රගතකරණය කිරීමේ (outsourcing) පිරිවැය සහ වාසි පිළිබඳව වර්තමානයේදී **සීමාසහිත බර්ට් සහ පුත්‍රයෝ සමාගමේ** කළමනාකරණය, සළකා බලමින් සිටී.

ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍රගතකරණය කිරීමේ [Business Process Outsourcing (BPO)] වාසි දෙකක්(02) ද, අවාසි දෙකක්(02) ද **සඳහන් කරන්න**. (ලකුණු 04)

(d) **සීමාසහිත බර්ට් සහ පුත්‍රයෝ සමාගමේ** ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් (stakeholders) හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |